Repeal

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1206/20 – 2001 ඔක්තෝබර් 17 වැනි බදාදා – 2001.10.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. -බී 4/96 ii

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ වරාය, නාවුක හා ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
වරාය, නාවුක හා ධීවර අමාත්‍ය.

2001 ඔක්තෝබර් මස 08 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2001 (මෝරා සහ මඩුවා මත්ස්‍ය වර්ගවල) මසුන් ඇල්ලීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෝරා හෝ මඩුවා යන මත්ස්‍ය වර්ගවල වරල් එම මත්ස්‍යයන්ගේ ශරීරයේ තිබෙනතාක් කල්, බලපත්‍ර දරන්නකු විසින් එම වර්ගවලට අයත් මත්ස්‍යයන් අල්ලනු ලැබිය හැකිය.

3. කිසිම බලපත්‍රධාරියෙකු විසින් මෝරා හෝ මඩුවා යන මත්ස්‍ය වර්ගවලට අයත් යම් මත්ස්‍යයකුගෙන් ඉවත් කරන ලද වරල් පමණක් ගොඩබිමට ගෙන ඒම නොකළ යුතු ය.

4. මේ නියෝගවල -

"බලපත්‍ර දරන්නා " යන්නෙන්, 1996 නොවැම්බර් මස 07 වන දින අංක 948/25 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක සන්තකය දරන තැනැත්තෙකු අදහස් වේ.

11-76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A-G 000608 - 1,545 (2001/10)